සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2019 ජනවාරි

## (AA25) ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම

(Business Law and Ethics)

2019-01-26
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (6) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න දහය (10) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.7 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශන සලකා බලන්න:

**(a)** එමගින් ජනාධිපති බලතල සහ කාර්යයන් පිළිබඳව කටයුතු සිදුකරයි.

**(b)** එමගින් ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය අතර බලතල බෙදීම සම්බන්ධයෙන් වන ගැටළු (issues) පිළිබඳව කටයුතු සිදුකරයි.

**(c)** එමගින් පොලිස් කොමිසම පිහිටුවීම, බලතල සහ කාර්යයන් පිළිබඳව කටයුතු සිදුකරයි.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

(1) **(a)** පමණි. (2) **(b)** පමණි.

(3) **(a)** සහ **(c)** පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ විශේෂ නීතියක් **නොවන්නේ** කුමක් ද?

(1) උඩරට නීතිය. (2) මුස්ලිම් නීතිය.

(3) ඉංග්‍රීසි නීතිය. (4) තේසවලාමෙයි නීතිය (Thesawalamai law).

1.3 පහත සඳහන් ඒවා අතුරෙන්, පුද්ගල නීතියක් (Private Law) සඳහා උදාහරණයක් **නොවන්නේ** කුමක් ද?

| | |
|---|---|
| (1) පවුල් නීතිය (Family Law). | (2) ගිවිසුම් නීතිය (Contract Law). |
| (3) පරිපාලන නීතිය (Administrative Law). | (4) දේපළ නීතිය (Property Law). |

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, ගණකාධිකාරීවරයෙකු විසින් මුහුණදෙනු ලබන ප්‍රධාන ආචාරධර්ම පිළිබඳ ගැටළුවක් (issue) වන්නේ කුමක් ද?

(1) කළමනාකාරීත්වයෙන් එල්ලවන පීඩනය.

(2) ආචාරධර්ම කෙරෙහි සංවේදීතාව (ethical sensitivity) අඩුබව.

(3) මූල්‍යමය වාර්තාවන් අත්හැරීම් (omission).

(4) ඉහත සඳහන් සියල්ලම.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, ගනුදෙනු කළ හැකි සාධන පත්‍රයක් (negotiable instrument) වන්නේ කුමක් ද?

| | |
|---|---|
| (1) නෞභාර පත (bill of lading). | (2) ණයවර ලිපිය (letter of credit). |
| (3) විනිමය බිල්පත (bill of exchange). | (4) මුදල් ඇණවුම (money order) |

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, වලංගු ගිවිසුමක් නිර්මාණය වීම (formation) සඳහා වන ප්‍රධාන අවශ්‍යතාවයක් **නොවන්නේ** කුමක් ද?

| | |
|---|---|
| (1) ප්‍රතිජ්ඨාව (consideration). | (2) ගිවිසුම්ගත ශක්නුතාවය (Capacity to contract). |
| (3) පාර්ශවයන් අතර එකඟතාවය. | (4) ගිවිසුමට ප්‍රවිශ්ඨ වන ස්ථානය (location). |

1.7 CIF ගිවිසුමක් සම්බන්ධයෙන් වන පහත සඳහන් කොන්දේසි සලකා බලන්න:

**(a)** ගිවිසුමේ ඇතුළත් විස්තරය අනුව භාණ්ඩ නැව්ගත කිරීම සම්බන්ධයෙන් විකුණුම්කරු වගකිව යුතුය.

**(b)** විකුණුම්කරු විසින් ගැනුම්කරුට වාසිදායක වන්නා වූ රක්ෂණ ගිවිසුමක් සඳහා කටයුතු පිළියෙල කළ යුතුය.

**(c)** සියලුම ආනයන බදු සහ රේගු ගාස්තු (wharfage charges) පවතී නම්, විකුණුම්කරු විසින් ඒවා ගෙවිය යුතුය.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශනය / ප්‍රකාශන වන්නේ:

| | |
|---|---|
| (1) **(a)** පමණි. | (2) **(a)** සහ **(b)** පමණි. |
| (3) **(b)** පමණි. | (4) **(a)** සහ **(c)** පමණි. |

*අංක 1.8 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.8 නියෝජ්‍යත්ව නීතිය යටතේ, ප්‍රධානියා සහ නියෝජිතයා අතර සම්බන්ධතාවය ඇති කෙරෙන ක්‍රම දෙකක්(02) සඳහන් කරන්න.

1.9 ශ්‍රී ලංකාවේ තිබෙන නියාමන ආයතන (regulatory institutions) දෙකක්(02) සඳහන් කරන්න.

1.10 වෘත්තීය ආචාරධර්මයන්හි මූලික මූලධර්මයක් ලෙස "රහස්‍යභාවය" යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 20)

*A කොටසෙහි අවසානය*

# <u>B කොටස</u>

අනිවාර්ය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

## 02 වන ප්‍රශ්නය

පොළොන්නරුවේ, **දයා ට්‍රේඩිං සමාගමේ** නියෝජිතයෙකු වශයෙන් **දයාබරත්**, පොළොන්නරුවේ **දයා ට්‍රේඩිං සමාගමට** ප්‍රවාහනය කිරීම සඳහා කොළඹ පිහිටි ගබඩාවකින් විශාල වානේ තොගයක් මිලදී ගත්තේය. පොළොන්නරුවේ පැවති ධාරානිපාත වර්ෂාව සහ ගංවතුර නිසා, එම තොග පොළොන්නරුවට යැවීමට **දයාබරත්ට** නොහැකි විය. ගංවතුර නිසා සන්නිවේදනය ද ඇණහිට තිබුණි. රජය විසින් පනවන ලද නව බද්දක් හේතුවෙන් වානේ මිල ඉහළ ගොස් තිබූ අතර, එම කාරණය පිළිබඳ නොදැන **දයාබරත්** මුළු වානේ තොගයම කොළඹ ගැනුම්කරුවෙකුට විකුණන ලදි. පසුව, **දයාබරත්** විසින් වානේ විකිණීමෙන් ලද මුදල් **දයා ට්‍රේඩිං සමාගමට** යැවීය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**දයාබරත්ගෙන්** අලාභය ඉල්ලා සිටීමට **දයා ට්‍රේඩිං සමාගමට,** හිමිකමක් තිබේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

පුරවැසියන් ලෙස අයිතිවාසිකම් තහවුරු කිරීම පිණිස මහජනතාව සම්බන්ධයෙන් නීති සහ රෙගුලාසි තිබේ. 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු අධිකාරී පනත සහ 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණ පනත, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වැදගත් පනත් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) පාරිභෝගික කටයුතු අධිකාරී පනත යටතේ ඇති වැරදි (offences) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) මුදල් විශුද්ධිකරණ පනත යටතේ නීතිවිරෝධී ක්‍රියාකාරකම් (unlawful activities) දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥා පනතෙහි භාණ්ඩ විකිණීම පාලනය කෙරෙන නීතිය ඇතුලත් වේ. ත්‍යාග සහ නොමිලේ සැපයෙන ප්‍රවර්ධන පිරිනැමීම්, කුලී පිට ගැනුම් ගිවිසුම් (hire purchase agreements), වැඩ සහ ද්‍රව්‍ය සඳහා ගිවිසුම් ආදී  වෙනත් සැපයුම් ගිවිසුම්වලින් භාණ්ඩ විකිණීමේ ගිවිසුම්, වෙන්කොට දැක්වීම (distinguish) වැදගත් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "භාණ්ඩ විකිණීමේ ගිවිසුමක්" යන්න **නිර්වචනය කරන්න.** (ලකුණු 02)

(b) ත්‍යාග සහ නොමිලේ සැපයෙන ප්‍රවර්ධන පිරිනැමීම්, භාණ්ඩ විකුණුම් ගිවිසුම් ලෙස සළකනු නොලබන්නේ ඇයිදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 05 වන ප්‍රශ්නය

**පෝල්** විසින් **සැම්** වෙත ඉටුකළ සේවාවක් වෙනුවෙන් **සැම් විසින් පෝල්** හට උදේ වරුවේදී චෙක්පතක් නිකුත් කරන ලදි. එහෙත්, **පෝල්** විසින් ඉටුකරන ලද කාර්යය පිළිගතහැකි ගුණාත්මක තත්ත්වයක නොමැති බව, සවස් වරුවේදී **සැම්** හට දැන ගැනීමට ලැබුණි. එමනිසා, **පෝල්ට** ගෙවීම නැවැත්වීමට ප්‍රතිනියෝගයක් (ගෙවීම නැවැත්වීමේ නියෝගයක්) සවස් වරුවේදී **සැම්** විසින් නිකුත් කරන ලදි. කෙසේවෙතත්, ගෙවීම නැවැත්වීමේ නියෝගය ඇතුළත් ලිපිය දින දෙකක් ඉකුත්වන තුරුත් බැංකුවේ කළමනාකරු අතට පත්වී නොතිබූ අතර, ඒ වන විට **පෝල්** විසින් චෙක්පත මුදල් කරගෙන තිබුණේය. චෙක්පතෙහි මුදල නැවත අයකර ගැනීමට **සැම්** බැංකුවට එරෙහිව නඩු පවරා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සැම්ට,** බැංකුවෙන් මුදල නැවත අයකර ගැනීමට හිමිකමක් තිබේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 06 වන ප්‍රශ්නය

ජාත්‍යන්තර වෙළඳාම යනු රටවල් දෙකක් අතර හෝ රටවල් දෙකක පදිංචිකරුවන් අතර කෙරෙන වෙළඳාමයි. ගැනුම්කරු සහ විකුණුම්කරු වෙනස් වූ රටවල් දෙකක පදිංචිව සිටින අතර, භාණ්ඩ එක් රටක සිට තවත් රටකට බෙදාහරිනු ලබයි. ණයවර ලිපි, විනිමය බිල්පත්, අයකර ගැනීමේ එකඟතාවයන් (collection agreements), විවෘත ගිණුම් හරහා ගෙවීම් (payments in open accounts), අත්තිකාරම් ගෙවීම් යනාදි වශයෙන් ජාත්‍යන්තර වෙළෙඳ ගනුදෙනුවලදී භාවිත කෙරෙන ගෙවීම් ක්‍රම රාශියක් තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ණයවර ලිපියක් ක්‍රියාත්මක කරනු ලබන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

# C කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 07 වන ප්‍රශ්නය

(a) පුණ්‍යායතනයක් වන **සෙත්සේවා පදනමේ** ගිණුම් ලිපිකාරිණියක ලෙස, වර්ෂයක කාලපරිච්ඡේදයක් සඳහා වන තාවකාලික පත්වීමක් **නයනී** ට ලැබුණි. පත්වීමේ ලිපියෙහි සේවක අර්ථසාධක අරමුදල් [Employees' Provident Fund (EPF)] හිමිකම පිළිබඳව සඳහන් කොට නොතිබුණි. ඇය සේවයේ යෙදෙන වර්ෂයක කාලපරිච්ඡේදය වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදල සඳහා ඇයට හිමිකම් තිබේදැයි දැනගැනීමට **නයනී** ට අවශ්‍යව ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත අවස්ථාව සම්බන්ධයෙන්, සේවක අර්ථසාධක අරමුදල් පනතේ ප්‍රතිපාදනවල අදාලත්වය (applicability) **විමසන්න**. (ලකුණු 05)

(b) **බර්ටි, සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමේ** දීර්ඝ කාලයක සිට සේවයේ නිරතව සිටී. රු.10,000/- ක මාසික වැටුපකට කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස ඔහු 2005 දෙසැම්බර් 01 දින සමාගමට බැඳුණේය. දැන් ඔහු රු.300,000/- ක මාසික වැටුපක් සහිතව සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා (CEO) ලෙස සේවය කරයි. 2019 ජනවාරි 31 දින සිට බලපැවැත්වෙන වන පරිදි සමාගමෙහි සේවයෙන් ඉවත්වීමට ඔහු තීරණය කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පාරිතෝෂික ගෙවීම් පනතේ ප්‍රතිපාදන අනුව **බර්ටිගේ** පාරිතෝෂික හිමිකම **ගණනය කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 08 වන ප්‍රශ්නය

ප්‍රාග්ධනයට එක හා සමානව දායක වෙමින් **කමල්, ගීතා** සහ **රාජා,** ප්‍රචාරණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාමට හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. එහි හවුල් ව්‍යාපාර ගිවිසුමක් නොතිබුණු අතර, 1890 හවුල් ව්‍යාපාර ආඥාපනත අනුගමනය කිරීමට ඔවුන් එකඟ විය. **ගීතා** ව්‍යාපාරය තුළ ඉතා ක්‍රියාකාරීව කටයුතු කරන අතර, සේවාදායකයන් සමග සියලුම ව්‍යාපාරික රැස්වීම්වලට ඇය සහභාගී වෙයි. **කමල්** ප්‍රාග්ධනයට එක හා සමානව දායක වුවද, ප්‍රචාරණ නියෝජිත ආයතනයෙහි එදිනෙදා කටයුතුවලින් ඉවත්ව සිටීමට ඔහුට අවශ්‍ය වේ. තවද, ඔහුගේ බිරිඳ මෙම ව්‍යාපාරයට හවුල්කරුවෙකු ලෙස හඳුන්වා දීමට ද ඔහුට අවශ්‍යව ඇත. කෙසේවෙතත්, **ගීතා** මෙම තීරණයට විරුද්ධ වූ අතර, හවුල් ව්‍යාපාරයේ ලාභවලින් අමතර කොටසක් ඇයට ලැබිය යුතුයැයි ඇය දැනුම් දුන්නාය. තවද, **රාජාගේ** ද මතය වී ඇත්තේ ව්‍යාපාරයේ කළමනාකාරිත්වය කෙරෙහි ඔහුගේ දායකත්වය වෙනුවෙන් ඔහුට වැටුපක් ගෙවිය යුතු බවයි. එලෙසම, **රාජාට** සහ **කමල්ට** ව්‍යාපාරයේ ස්වභාවය (nature) වෙනස් කිරීමට ද අවශ්‍යව ඇති අතර, **ගීතා** එයට ද දැඩිලෙස විරුද්ධත්වය පෑවාය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**කමල්, ගීතා** සහ **රාජාගේ** අයිතිවාසිකම් සහ යුතුකම් (rights and duties) පිළිවෙලින් **විමසන්න**. (ලකුණු 10)

## 09 වන ප්‍රශ්නය

කෝවලස්වාමි ව්‍යාපාරිකයෙකු වූ **මධුර,** ඔහුගේ කෝවලස්වාමි ව්‍යාපාරය ඔහුද කොටස්කරුවෙකු වූ **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගමට** විකුණුවේය. ව්‍යාපාරය විකුණන ලද අවස්ථාවේදී, **මධුරගේ** නමින් රක්ෂණය කර තිබූ කෝවලස්වාමි ව්‍යාපාරයේ සියලුම දේපළ ද **සීමාසහිත XYZ (පෞද්ගලික) සමාගමට** පවරන ලදි. දේපළ පැවරීමෙන් පසුව, එම දේපළ අතුරෙන් එක් දේපළක් ගින්නෙන් විනාශ වූ අතර, රක්ෂණ ගිවිසුම ප්‍රථමයෙන් ඔහුගේ නමින් ලබාගෙන තිබූ බැවින් **මධුර** ඒ සඳහා රක්ෂණ සමාගමෙන් හානි සඳහා හිමිකම් පෑවේය. කෙසේවෙතත්, රක්ෂණ සමාගම **මධුරට** වන්දි ගෙවීම ප්‍රතික්ෂේප කළේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) රක්ෂණ සමාගමට **මධුරගේ** හිමිකම් පෑම ප්‍රතික්ෂේප කළහැකිදැයි **විමසන්න**. (ලකුණු 06)

(b) "හානිපූර්ණය" (indemnity) නම් රක්ෂණ සංකල්පය **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

## D කොටස

අනිවාර්ය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

### 10 වන ප්‍රශ්නය

(a) **ප්‍රියාගේ** මිතුරෙකු වූ **රොමේෂ්** ඔහුගේ කාර් රථය විකිණීමට උත්සාහ කරන බව ඇයට දැනගැනීමට ලැබුණි. **ප්‍රියා** විසින් *"මට ඔබගෙන් ප්‍රතිචාරයක් නොලැබුණහොත්, කාර්රථය රු. මිලියන 2 කට මගේ යැයි සලකමි"* යනුවෙන් සඳහන් කර විද්‍යුත් තැපැල මගින් කාර් රථය මිලදී ගැනීමට අර්පණය කරන ලදී. **රොමේෂ්** අර්පණය ප්‍රතිග්‍රහණය කිරීමට අදහස් කළ නමුත්, ඔහුගේ ප්‍රතිග්‍රහණය **ප්‍රියාට** සන්නිවේදනය නොකළේය. පසුව, **රොමේෂ්** විසින් රු. මිලියන 2.5 කට කාර්රථය **ඇන්ට** විකුණන ලදී.

**ප්‍රියා, පෝල්** සමග විවාහ වීමට සැලසුම් කර ඇති අතර, ඇගේ මංගල්‍යය සඳහා ඇණවුමක් බාරදීමට ඇය **මල් මල් ෆ්ලෝරිස්ට්** වෙත ගියාය. ඔවුන් විසින් තෝරාගත් තේමාවට අනුව ස්වභාවික රතු සහ සුදු රෝස මල් යොදා සියලුම මල් සැරසිලි පිළියෙල කිරීමට මල් සැරසිලිකරු (florist) එකඟ වන ලදී. ගෙවිය යුතු ප්‍රමාණයෙන් 75% ක් කලින් ගෙවූ අතර, ඉතිරිය මංගල දිනයේදී ගෙවීමට **ප්‍රියා** එකඟ වූවාය. මංගල දිනයට පෙර දිනයේ මුළු දිවයින පුරා ධාරානිපාත වර්ෂාවක් ඇති වූ අතර, දරුණු ගංවතුර නිසා මාර්ග සියල්ල අවහිර විය. **මල් මල් ෆ්ලෝරිස්ට්** හට ප්‍රමාණවත් තරම් ස්වභාවික රතු සහ සුදු රෝස මල් සපයාගත නොහැකි වූ අතර, **ප්‍රියාගේ** සහ **පෝල්**ගේ විවාහ මංගල්‍යයේ මල් සැරසිලිවලට ඔවුන්ගේ ශීත ගබඩා කාමරවල තිබූ ස්වභාවික රෝසමල් සමඟ කෘත්‍රිම සුදු රෝසමල් සමහරක් යෙදීමට සිදුවිය. මල් සැරසිලිකරු විසින් සිදුකළ මෙම වැරැද්ද **ප්‍රියාට** දැනගැනීමට ලැබුණු අතර, ගෙවිය යුතු ඉතිරි මුදල ගෙවීම **ප්‍රියා** ප්‍රතික්ෂේප කරන ලදී.

**ප්‍රියාට, රොමේෂ්ගෙන්** සහ **මල් මල් ෆ්ලෝරිස්ට්ගෙන්** හානි සඳහා හිමිකම් පෑමට අවශ්‍යව ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **විමසන්න**:

(i) **ප්‍රියා** සහ **රොමේෂ්ගෙන්** අතර වලංගු ගිවිසුමක් තිබේද යන්න. (ලකුණු 06)

(ii) **රොමේෂ්ගෙන්** සහ **මල් මල් ෆ්ලෝරිස්ට්** සම්බන්ධයෙන් **ප්‍රියාගේ** නෛතික හිමිකම. (ලකුණු 09)

(b) **වීනා, "ස්කින් ඇන්ඩ් හෙයාකෙයා"** රූපලාවන්‍යාගාරය වෙතින් මුහුණු ආලේපනයක් (face cream) මිලදී ගත්තාය. එම ආලේපනය ඇගේ මුහුණේ ආලේප කර විනාඩි කිහිපයකින් පසු සමෙහි ආසාදනයකින් ඇය වේදනා වින්දාය. ඇය රෝහල වෙත ගෙනයනු ලැබූ අතර, මුහුණු ආලේපනයේ අඩංගු මූලද්‍රව්‍යයක් හේතුකොටගෙන සමෙහි ආසාදනය සිදුවී ඇති බව වෛද්‍යවරයා විසින් විනිශ්චය (diagnosed) කරන ලදී. **වීනාට** දින 5 ක් රෝහල්ගතව සිටීමට සිදුවූ අතර, ඇයට මේ නිසා සේවයට වාර්තා කිරීමට ද නොහැකි විය.

**වීනාගේ** සහෝදරයා වූ **සුරාජ්, සීමාසහිත බියුටිෆුල් හෝම්ස් (පෞද්ගලික) සමාගමෙන්** තේක්ක කෑම මේසයක් ඇණවුම් කළේය. සති දෙකක් තුළ එය රැගෙනවිත් බාරදෙන බවට සමාගම විසින් **සුරාජ්ට** පොරොන්දු විය. එහි මෝස්තරය (design) පිළිබඳ විස්තර සම්බන්ධයෙන් **සුරාජ්** විසින් නිශ්චිත ලෙස කළමනාකරුට උපදෙස් දෙන ලදී. **සීමාසහිත බියුටිෆුල් හෝම්ස් (පෞද්ගලික) සමාගම** විසින් කෑම මේසය එකඟ වූ කාලය තුළ ගෙනැවිත් බාරදෙන ලද නමුත් එය තේක්ක වලින් සාදා නොතිබූ අතර, **සුරාජ්** ඉල්ලා සිටි නිශ්චිත මෝස්තරයට ද අනුකූල නොවීය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ පහත දෑ **විමසන්න**:

(i) **වීනාට** තිබෙන නෛතික හිමිකම් සහ ප්‍රතිකර්ම (remedies). (ලකුණු 05)

(ii) **සුරාජ්ට** තිබෙන නෛතික හිමිකම් සහ ප්‍රතිකර්ම. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>අවබෝධය<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | හඳුනා දක්වන්න | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | සඳහන් කරන්න | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම. |
| | විමසන්න | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | පැහැදිලි කරන්න | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | අර්ථකතනය කරන්න | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | හඳුනාගන්න | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | සටහන් කරන්න | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | සාරාංශගත කරන්න | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>භාවිතය<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | ප්‍රදර්ශනය කරන්න | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | පිළියෙල කරන්න | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | ප්‍රමුඛතා දක්වන්න | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | සසඳන්න | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>විශ්ලේෂණය<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | සමානකම් බලන්න | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |